

# පාරාදීසයේ දොර එළිපත

# 'හිමිදිරි අඩවිය'

යූ පී.එස්.පතිරණ

**ශ්‍රී ලංකාව පාරාදීසයක් බවට ප්‍රකටව ඇත්තේ දූරාතීතයේ සිට ය. ඒ බව 14 වන සියවසේ සිටි ජෝන් ඩී.මාරිඥලි නැමැත්තෙකුගේ ප්‍රකාශනයකිනැ ද පැවසේ. සැබැවින්ම භූ විද්‍යාත්මකව සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව යනු සුවිශේෂී භූ පිහිටීමෙකින් යුතු ස්වභාවික සෞන්දර්යෙන් අගතැන්පත් රටෙකි. වර්ග කිලෝමීටර් 65610 ක් තරම් කුඩා භූමි ප්‍රමාණයක පිහිටි ස්වභාව ධර්මයේ ආශ්චර්ය රැසක් නිසාම පාරාදීසය යන්න ශ්‍රී ලංකාවට වඩාත් උචිත ය.**


කෙසේ වුවද, ස්වභාව ධර්මයේ රීතියට පටහැනිව සිදුවන අනුවණ මිනිස් ක්‍රියාකාරකම් නිසාම අද ශ්‍රී ලංකාවේ සොබාදම් දිනිතියගේ විස්කම් නිමවුම් බොහොමයකම පැවැත්ම අවදානමට ලක්වී ඇති බව නොරහසකි. එවන් එක් පරිසර පද්ධතියක් ලෙසට මෝතිංසයිඩ් නමින් වඩාත් ප්‍රකට හිමිදිරි අඩවිය නොහොත් අරුණාලෝක අඩවිය හඳුන්වාදිය හැකි ය.

උදෑසන හිරුපායා මුදුන් වී දැඩි රශ්මිය පතුරා සවස් වරුවේ බැස ගොස් රාත්‍රිය උදාවීම ඔබ අප සැමද අත් දකින ඒකාකාරී අත්දැකීම් වුවද මෙම හිමිදිරි අඩවිය තුළ උදෑසන සිට සවස්යාමය තෙක් නෙත ගැටෙනුයේ හිමිදිරියාමයක දසුන පමණි. දිවා කාලය පුරාම හිමිදිරි යාමයේ සීතල මීදුමත්, සිරි සිරි පින්නත් මද අඳුරත් හැරුණු විට මෙහි දහවලක් උදාවනු දැකිය නොහැකිවීම මෙම පරිසරයේ ඇති විස්මිත නිමවුමයි යටත් විජිත සමයේ ඉංග්‍රීසින් විසින් මෙම පරිසරය සහිත වතුයායට "මෝතිංසයිඩ්" යන නම දී ඇත්තේ ඉහත අරුම පුදුම හා ආගන්තුක ස්වභාවය සැලකිල්ලට ගැනීමෙනි.

කොළඹ සිට රත්නපුර හරහා පැල්මඩුල්ලෙන් හැරී කහවත්ත, මාදම්පේ, ඔස්සේ රක්වාන තෙක් පැමිණ දෙනියාය දක්වා වූ වංගු සහිත මාර්ගය ඔස්සේ ගියවිට රක්වාන සිට මෙම හිමිදිරි අඩවියට ඇත්තේ කි.මී 26 ක් පමණි.

රක්වාන ඔස්සේ මෝතිංසයිඩ් වෙත ඇදෙන සංචාරකයෙකුට දිවයිනේ වෙනත් තැනකදී දැකිය නොහැකි ආකාරයේ දසුන් රැසක් ද නෙතට හසුකර ගත හැකි ය. රක්වාන සිට සූරියකන්ද දක්වා දිවෙන මාර්ගය ඉතා දැකුම්කළු කඳු නැග්මෙකි. මහියංගනයට ළඟාවන විට හමුවන 18 වංගුවට සමාන වංගු 10 ක් රක්වාන සිට සූරිය කන්දට යන මාර්ගයේ දි හමුවේ. හරිත ශාක වැස්මෙන් යුතු සූරියකන්ද සුන්දරත්වයෙන් ඉතා අගතැන්පත් වුවද, එය වඩාත් ප්‍රකටව ඇත්තේ 1988/89 අඳුරු යුගයේ රටේ මහත් ආන්දෝලනයයට ලක්වූ ස්ථානයක් වශයෙනි. සූරියකන්දට පැමිණී විට ඝණ කැලෑවෙන් වැසුණු සිංහරාජ වනාන්තරය නෙතට හසුකර ගත හැකි ය. සූරියකන්ද දෙනියාය මාර්ගයේ කි.මි.11 ක් පමණ ගියවිට හමුවන දකුණුපස මාර්ගය සුන්දරත්වය මහත් ඉහළින් විඳගත හැකි තවත් ස්ථානයක් වන බුළුතොට දුර්ගය වනට ළඟාවිය හැකි ය. බුළුතොට දූර්ගයට හැරෙන මංසන්ධියේ සිට මෝතිංසයිඩ් හෙවත්, හිමිදිරි අඩවිය වෙත ඇත්තේ කි.මි.7 ක පමණ දුරකි. මෝතිංසයිඩ් වතුයායට හැරෙන මාර්ගය සොයාගැනීමට පහසුවනසේ නාම පුවරුවක් සවිකර තිබේ. බොහෝවිට වැසි සහිත කාලගුණයත්, මීදුමත් අත්විඳිය හැකි එම අතුරු මාර්ගය ඔස්සේ ගමන්කළ හැක්කේ ෆොවිල් ඩ්‍රයිව් වාහනයක හෝ කැන්ටරයකට වැනි වාහනයකට පමණි. හේතුව එම මාර්ගය වල ගොඩැලි හා මඩ සහිත වීම නිසයි.

අක්කර 8000 කින් පමණ සමන්විත මෝතිංසයිඩ් හා තංගමලේ තැන්න ප්‍රදේශය තුළ එනසාල් වගාවට යටවුනු මෝතිංසයිඩ් වතුයාය පිහිටා ඇති අතර, එහි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන අඩවි බංගලාවක් ද පිහිටුවා තිබේ. මෝතිංසයිඩ් බංගලාව පිහිටියේ එතැන් සිට තවත් කිලෝ මීටර් තුනක් පමණ ඔබ්බෙනි. පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට අයත් මෝතිංසයිඩ් වතුයායේ ප්‍රධාන වැවිල්ල වී ඇත්තේ එනසාල් වුවද, මෙම පරිසරය තුළ පවතින ජෛව විවිධත්වය පිළිබඳව අවතක්සේරුවක් කළ නොහැකි තරම් ය.



මීදුම්පතනයත්, අධික ශීතලත් ඔස්සේ මෝතිංසයිඩ් දෙසට ඇදීයන විට දිස්වන තංගමලේ කඳුයාය මනරම් දසුනෙකි. තංගමලේ යනු දමිළ බසින් රත්තරන් කන්දයි. අතීතයේ මෙම ප්‍රදේශයෙන් රත්තරන් ලැබුණු බවට ජනප්‍රවාදයේ පැවසේ. පරිසර පද්ධතියක් ලෙස සැලකිල්ලට ගැනීමේ දී මෙම මෝතිංසයිඩ් - තංගමලේ පරිසර පද්ධතිය තුළ වෙසෙන සත්ත්ව ප්‍රජාව ද වැදගත් වේ.

ගෝනා, වල් ඌරා, දිවියා, හාවා, දඬුලේනා, මෙහි සීතල මීදුම් සහිත හිමිදිරි ආලෝකය අතරින් දුවපැන යනු බොහෝ විට දර්ශනය කළ හැකි ය. එනසාල් වගාව අතරින් කීන, ඇඹුල්පේර, මඩොල්, දියපර. බදුල්ල වැනි ගස්වලින් මෙන්ම මෙහි කඳුකර මායිමේ සිංහරාජ අඩවියේ දැකිය හැකි විශාල වෘක්ෂලතාදිය ද දැකගත හැකි ය.

මෙම හිමිදිරි අඩවිය වෙත ඇදෙන සංචාරකයෙකුට සතුටුදයක නවාතැන් පහසුකම් රක්වාන නගරයේ දී සලසාගත හැකි අතර දවසක් දෙකක් මෙම ප්‍රදේශය තුළ රැඳී සිට නැරඹිය හැකි සෞන්දර්යාත්මක හා සංස්කෘතික ආකර්ෂණ රැසක් ද අවට ඇති බව ද අමතක කළ යුතු නොවේ.

වවුල්පනේ හුණුගල් ගුහාව, මඩුවන්ගල වලව්ව හා දියඇලි කොමලියන් රැසක් ද ඒ අතරට ඇතුළත් වේ.

වත්මනෙහි තේ වගාව හා එනසාල් වගාව සඳහා අවිධිමත් ලෙස භූමිය හෙළිපෙහෙළි වීම මෙන්ම සමහර දේශපාලන බලධාරීන් විසින් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා කෙරෙන අරගල ද මෙම හිමිදිරි අඩවියේ තිරසාර භාවයට බලවත් තර්ජනයක් එල්ල වෙමින් පවතින බව ද අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත. ❑

